**ශීර්ෂය 192 - නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 192 - නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.1 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 7,620.78 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7,270.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 350.62 ක් හෙවත් සියයට 4.60 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 6,640.85 | 6,566.02 | 74.83 | 1.13 |
| මූලධන | 979.93 | 704.14 | 275.79 | 28.14 |
| **එකතුව** | **7,620.78** | **7,270.16** | **350.62** | **4.60** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 20.00 | 0.98 | 10.50 | 11.40 | 618.00 | 167.73 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන අංක 6000/0000/00/0016/0087/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 53.17 ක් විය..

**2.4 විගණන නිරීක්ෂණය**

අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන විසර්ජන සම්මත වැය ලෙජරය යාවත්කාලීන කර පවත්වා නොතිබුණු අතර අනෙකුත් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| (ඇ) | විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 |

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලධන වැය විෂයයන් 5 ක හා පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. මිලියන 4.35 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ii) වැය විෂයයන් 21 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 19201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.3,335,319 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, 2016 ඔක්තෝබර් 01 දින වන විටත් එම ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.4 කාර්යසාධනය**

මෙම අමාත්‍යාංශය 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථාවන් 04 ක් යටතේ අදාළ කාර්ය භාර්යයන් සංශෝධනය කර තිබූ අතර, සමස්ථයක් වශයෙන් අමාත්‍යාංශයේ අරමුණු සහ එම අරමුණු කරා ලගාවීම්වලට අදාළ කාර්යසාධනය පහත දැක්වේ.

| අරමුණු | අරමුණු කරා ලගාවීම් |
|---|---|
| • සෑම පුරවැසියෙකුටම බියෙන් හා සැකෙන් තොරව ජීවත්විය හැකි සාමකාමී වටපිටාවක් පවත්වාගෙනයාම සඳහා සමානාත්මතාවයෙන් යුතුව නීතිය ක්‍රියාත්මක කිරීම. | රට තුළ වාර්තාවන අපරාධ විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා උපාය මාර්ගික මඟපෙන්වීම් මත 2013 වර්ෂයේ වාර්තා වූ 1,172,793 ක අපරාධ සංඛ්‍යාව 2014 වර්ෂයේදී 1,180,805 දක්වා වර්ධනය වී තිබූ අතර 2015 වර්ෂයේදී එය 1,129,555 ක් දක්වා අඩු වී තිබුණි. එමෙන්ම |

- විවිධ අපරාධ සමාජ විරෝධී ක්‍රියා සහ හිංසන වැළැක්වීමට හා මැඩපැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීම සහ විවිධ අපරාධ සමාජ විරෝධී ක්‍රියා සහ හිංසන සිදුකරන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීම තුළින් සමාජ අපරාධ බිය තුරන් කිරීම.

ළමයින්ට එරෙහිව වාර්තා වූ අපරාධ ප්‍රමාණයන් මෙන්ම කාන්තාවන්ට එරෙහිව වාර්තා වූ අපරාධ දෙස බැලීමේදී 2013 වර්ෂයේදී වාර්තා වූ අපරාධ සංඛ්‍යාව 14,360 ක් වූ අතර 2014 වර්ෂයේදී එය 14,302 ක් වී තිබුණි. 2015 වර්ෂයේදී වාර්තා වූ අපරාධ සංඛ්‍යාව 14,199 දක්වා අඩු වී තිබුණි.

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී පොත්වලින් කපා හරින ලද රු.2,895,986 ක් වූ අලාභ අයිතම 22 ක් 2015 වර්ෂයේදී ද ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙනවිත් තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී කපා හැරීම් ලෙස ගිණුම් වල වාර්තා කර තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දින වන විට අයිතම 143 කට සිදු වී තිබුණු අලාභහානිවල වටිනාකම රු.28,407,203 ක් වී තිබුණි. එම අලාභහානි වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, ඒවා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ පාර්ශවයන්ගෙන් එම අලාභහානි අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරිමට හෝ අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 16 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 | |
| (iii) | ද්විතියික මට්ටම | 65 | 85 | - | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 34 | 29 | 05 | - |
| | **එකතුව** | **121** | **132** | **09** | **20** |